# ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 42/17 — 1973 ජනවාරි 15 වැනි සඳුද — 1973.01.15

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදි)

# I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

ජනා. කා. අංකය : ඩබ්ලිව්. 68(22)/73.

### මහාජන ආරක්ෂක ආඥාපනත (40 වැනි අධිකාරය)

අගමැතිගේ නිර්දේශය අනුව මහාජන ආරක්ෂක ආඥාපනතේ 5 වැනි වගන්තිය යටතේ ජනාධිපතිවරයා විසින් සාදනු ලැබූ නියෝග.

වි. ගොපල්ලව,
ජනාධිපතිවරයා.

1973 ජනවාරි මස 15 වැනි දින,
කොළඹ දී ය.

### නියෝග

1. මෙම නියෝග 1973 අංක 1 දරන හදිසි අවස්ථා (කුඹුරු) නියෝග යනුවෙන් හඳුන්වනු ලැබිය හැකිය.

2. යම් ප්‍රදේශයක් සඳහා වූ ගොවි කාරක සභාවක සාමාජිකයන්ගේ නිල කාලය 1971 මාර්තු මස දහසය වැනි දින හෝ ඉන් පසු ඉකුත් වී ඇති අවස්ථාවක, පනතෙහි හෝ එය යටතේ සාදනු ලැබූ යම් නියෝගවල පටහැනිව කුමක් සඳහන්ව ඇතද එය නොතකා ගොවි කාරක සභාවේ එම සාමාජිකයන් එම ප්‍රදේශය සඳහා වූ යථා පරිදි සංස්ථාපිත ගොවි කාරක සභාවේ සාමාජිකයන් වශයෙන් නොකඩවාම නිල දැරිය යුතුය :

එසේ වුවද එබඳු යම් ගොවි කාරක සභාවක් විසින් මේ පනතෙහි විධිවිධාන කිසිවක් හෝ මේ පනත යටතේ සාදනු ලැබූ නියෝග කිසිවක් උල්ලංඝනය කරනු ලැබුවහොත් කොමසාරිස් විසින් එම ගොවි කාරක සභාව විසුරුවා හැරිය හැකිය.

3. 1971 මාර්තු මස දහසය වැනි දිනයට පෙර කාලය ගෙවී යාමෙන් යම් ප්‍රදේශයක් සඳහා වූ යම් ගොවි කාරක සභාවක සාමාජිකයන්ගේ නිල කාලය අවසන් වූ අවස්ථාවක, හෝ යම් ප්‍රදේශයක් සඳහා වූ යම් ගොවි කාරක සභාවක සාමාජිකයන් ඉල්ලා අස්වීම හේතුකොටගෙන එම කාරක සභාවට ක්‍රියා කළ නොහැකි වන අවස්ථාවක, ඒ ප්‍රදේශය සඳහා අලුත් කාරක සභාවක් සංස්ථාපනය කරනු ලබන තෙක් ඒ ප්‍රදේශය සම්බන්ධයෙන් පනත යටතේ හෝ අන් කිසි ලිඛිත නීතියක් යටතේ වූ ගොවි කාරක සභාවක බලතල, යුතුකම් හා කාර්‍ය්‍යයන් සියල්ල හෝ ඉන් යමක් පාවිච්චි කිරීම, කිරීම හෝ ඉටුකිරීම කොමසාරිස් විසින් හෝ ඔහු විසින් ඒ සඳහා බලය පවරනු ලැබූ යම් තැනැත්තකු විසින් කළ හැකිය.

4. යම් ප්‍රදේශයක් සඳහා වූ කුඹුරු නාම ලේඛනය ප්‍රතිශෝධනය කිරීම, පනත යටතේ සාදනු ලැබූ නියෝග අනුව 1971 ජූනි මස පළමුවැනි දිනයට පෙරාතුව ආරම්භ වීමට නියමිතව ඇති අවස්ථාවක, පනතෙහි හෝ එය යටතේ පනවනු ලැබූ යම් නියෝගවල පටහැනිව කුමක් සඳහන්ව ඇතද එය නොතකා එබඳු ප්‍රතිශෝධනයක් කිරීම බාර නොගත යුතු අතර 1971 මැයි මස 31 වැනි දින වලංගුව පැවති කුඹුරු නාම ලේඛනය වලංගු වූත් යථා පරිදි සහතික කරනු ලැබූත් නාම ලේඛනය වශයෙන් සැලකිය යුතුවාත් හැර, එපරිද්දෙන් ඒ නාම ලේඛනය 1971 ජූනි මස පළමුවැනි දින සහ ඉන් පසුව වලංගුව පැවතිය යුතුය :

එසේ වුවද යම් විශේෂ අවස්ථාවක යෙදී ඇති කරුණු අනුව යම් ප්‍රදේශයක් සඳහා වූ යථා පරිදි සහතික කළ කුඹුරු නාම ලේඛනයක් ප්‍රතිශෝධනය කිරීම අවශ්‍ය යයි කොමසාරිස් අදහස් කරන අවස්ථාවක, එසේ ප්‍රතිශෝධනය කිරීමට අදාළව පනතෙහි හෝ එය යටතේ සාදනු ලැබූ නියෝග කිසිවක පටහැනිව කුමක් සඳහන්ව ඇතද නාම ලේඛනය ප්‍රතිශෝධනය කිරීම සඳහා අවශ්‍ය යයි තමා අදහස් කරන පියවර කොමසාරිස් විසින් ගත හැකිය ; තවද එසේ ප්‍රතිශෝධනය කරනු ලැබූ නාම ලේඛනය එකී ප්‍රදේශය සඳහා වූ කුඹුරු නාම ලේඛනය වශයෙන් සියලු කාර්‍ය්‍යයන් සඳහා සැලකිය යුතුය.

5. මෙම නියෝගවල—

"පනත" යන්නෙන් 1958 අංක 1 දරන කුඹුරු පනත අදහස් වේ ;

"කොමසාරිස්" යන්නෙන් ගොවිජන සේවා කොමසාරිස්වරයා හෝ නියෝජ්‍ය ගොවිජන සේවා කොමසාරිස්වරයකු අදහස් වන අතර තමන් පත් කරනු ලැබූ දිස්ත්‍රික්කවල කොමසාරිස්වරයාගේ බලතල පාවිච්චි කරන සියලුම සහකාර ගොවිජන සේවා කොමසාරිස්වරු ද ඊට ඇතුළත් වෙති ; තවද

"ගොවි කාරක සභාව" යන්නෙන් පනත යටතේ පිහිටුවා ඇති ගොවි කාරක සභාවක් අදහස් වේ.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදි

26/49——කේ 18869—2,500 (72/12)